# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2078/29 - 2018 ජූලි මස 03 වැනි අඟහරුවාදා - 2018.07.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (I) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (I) වන ව්‍යවස්ථාවේ I වන ඡේදයේ නියමයන්ට අනුකූලව පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 1955/22 හා 2016.02.25 සහ අංක 2016/37 හා 2017.04.26 දිනැති අති විශෙෂ *ගැසට්* නිවේදන මඟින් සංශෝධිත, අංක 1941/41 හා 2015.11.20 දිනැති අති විශෙෂ *ගැසට්* නිවේදනයෙහි පළ කරනු ලැබ ඇති උපලේඛණයෙහි I කොටසෙහි, අංක 20 යටතේ නව විධිවිධාන ඇතුලත් කරමින් එම උපලේඛනයේ I කොටස 2018.06.12 දින සිට බලපවත්වන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1A - G 27997 – 08 (2018/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *I වන තීරුව*<br>*නිලධර ගණය* | *II වන තීරුව*<br>*බලතල පවරනු ලබන*<br>*රාජ්‍ය නිලධාරීන්* | *III වන තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 20. පොලිස් ආරක්ෂක සහායක නිලධාරීන් | පොලිස්පති | I රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීම් පරිපාටි/ සේවා ව්‍යවස්ථා අනුව පත් කිරීම් හා උසස් කිරීම්<br>II රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම<br>III විනය පාලනය හා සේවයෙන් පහ කිරීම<br>IV රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 3/2016 ප්‍රකාරව කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබා දීම. |
| | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | I රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටි වලට අනුව අදාල බල ප්‍රදේශය තුළ ස්ථාන මාරු කිරීම.<br>II සේවයෙන් පහ කිරීම හැර විනය පාලනය |
| | නියෝජ්‍ය පොලිස්පති | I රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටි වලට අනුව අදාල බල ප්‍රදේශය තුළ ස්ථාන මාරු කිරීම |
| | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී (පොලිස් අධිකාරී I ශ්‍රේණිය) | I රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ස්ථාන මාරු පටිපාටි වලට අනුකූලව, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී (පොලිස් අධිකාරී I ශ්‍රේණිය) පරිපාලන කොට්ඨාසය තුල ස්ථාන මාරු කිරීම. |
| | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, නියෝජ්‍ය පොලිස්පති, පොලිස් අධිකාරී, සහකාර පොලිස් අධිකාරී | I අදාල පරිපාලන බල ප්‍රදේශය තුල විනය ශාලා දඬුවම් නියම කිරීම |

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 1941/41 හා 2015.11.20 දිනැති *අතිවිශෙෂ ගැසට් නිවේදනයෙහි* අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එම්.ඒ.බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2018 ජුනි මස 25 වැනි දින
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නො. 1200/9,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07-560

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.